# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2026 අගෝස්තු මස 21 වන දින

## II වන කොටස

## අතිරේකය

(2026.08.24 දින නිකුත් කරන ලදී)


# විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)

**(218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි**

අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගේ නියමය පරිදි පළකරන ලදී


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

**මිල : රු. 44.00** **තැපැල් ගාස්තුව : රු. 150.00**

මෙම ගැසට් අතිරේකය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

**නීතිය බලපෑමේ ප්‍රකාශය**

***2 වන වගන්තිය :*** මේ වගන්තිය මගින් (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 77අ වන වගන්තිය සංශෝධනය කරනු ලබන අතර සංශෝධිත පරිදි ඒ වගන්තියේ නීතිය බලපෑම වනුයේ -

(අ) ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදය යටතේ සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් විමර්ශකවරුන් විසින් තහනමට ගන්නා ලද යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් ඒවායෙහි සාම්පලයක් රඳවා තබා ගැනීමෙන් පසුව, නඩු විභාගය අවසන් වීමට පෙර විනාශ කිරීම සඳහා වන යාන්ත්‍රණයක් හඳුන්වා දීම; සහ

(ආ) ඒ වගන්තිය යටතේ ආණ්ඩුවේ රසපරීක්ෂකවරයාගේ වාර්තාව නිකුත් කිරීම කඩිනම් කිරීම,

වේ.

## විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)

එල්.ඩී.- ඕ. 8/2026

## (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2026 අංක     දරන විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (218 වන අධිකාරය වූ) විෂවර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග ආඥාපනතේ 77අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 218 වන අධිකාරයේ 77අ වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) මේ ආඥාපනතේ V වන පරිච්ඡේදය යටතේ සිදු කරන ලද වරදක් සම්බන්ධයෙන් යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් තහනමට ගනු ලබන යම් විමර්ශකවරයකු විසින්, වහාම -

(අ) හැකි අවස්ථාවල දී වීඩියෝ පටිගත කිරීම් ද සමග, ඒ ඖෂධයේ, ද්‍රව්‍යයේ, භාණ්ඩයේ හෝ සැකසුමේ ඇසුරුම් සහ මුද්‍රා ද ඇතුළුව, ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම එය පැවති මුල් ස්වරූපයෙන්, ඡායාරූප ගැනීම සිදු කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඒ ඖෂධයේ, ද්‍රව්‍යයේ, භාණ්ඩයේ හෝ සැකසුමේ ප්‍රමාණය අන්තර්ගත වාර්තාවක් ද සමග ඒ ඡායාරූප, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික යන දෙයාකාරයෙන් ම

PL 15887 - 465 (2026/08)

සහ ඒ වීඩියෝ පටිගත කිරීම්, අදාළ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කිරීම හෝ සම්ප්‍රේෂණය කිරීම සිදු කරනු ලැබිය යුතු ය.'';

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 116 වන වගන්තියේ (3) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් විමර්ශකවරයකු විසින් මේ ආඥාපනතේ V වන පරිච්ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් තහනමට ගනු ලබන අවස්ථාවක දී, ඒ විමර්ශකවරයා විසින් -

(අ) 54අ වන වගන්තිය යටතේ වන වරදක් සඳහා මහාධිකරණය ඉදිරියේ අධිචෝදනා ඉදිරිපත් කරනු ලැබීමට සැකකරු යටත් විය යුතු බව විමර්ශකවරයාගේ මතය වන්නේ නම්; හෝ

(ආ) ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම පරීක්ෂණය සඳහා ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කිරීම සුදුසු බවට මහෙස්ත්‍රාත්වරයා විසින් සලකනු ලබන විට, මහෙස්ත්‍රාත්වරයා විසින් එසේ ඉදිරිපත් කිරීම සඳහා ආඥාවක් කරනු ලබන්නේ නම්,

ඒ තහනමට ගන්නා ලද ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම පරීක්ෂණය සඳහා ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1ආ) (1අ) වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, විමර්ශකවරයා විසින් කැනබිස් සැටිවා එල්. තහනමට ගනු ලබන අවස්ථාවක දී, විමර්ශකවරයා විසින් එහි සාම්පලයක් පමණක් පරීක්ෂණය සඳහා ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර ඉතිරි ප්‍රමාණය මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවකට අනුව වහාම විනාශ කරනු ලැබිය යුතු ය. ඉන් අනතුරුව ඒ විනාශ කිරීම පිළිබඳ වාර්තාවක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1ඇ) 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 116 වන වගන්තියේ (3) වන උපවගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද -

(අ) විමර්ශකවරයකු විසින්, මේ ආඥාපනතේ V වන පරිච්ඡේදය යටතේ වන වරදක් සම්බන්ධයෙන් යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් තහනමට ගනු ලබන අවස්ථාවක දී; සහ

(ආ) 54අ වන වගන්තිය යටතේ වන වරදක් නොවන යම් වරදක් සම්බන්ධයෙන් සැකකරු මහෙස්ත්‍රාත්වරයකු වෙත ඉදිරිපත් කිරීමට නියමිත අවස්ථාවක දී,

මහෙස්ත්‍රාත්වරයාගේ ආඥාවකට අනුව, විමර්ශකවරයා විසින්, (6) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි පරිදි, ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම වහාම විනාශ කරනු ලැබිය යුතු අතර ඉන් අනතුරුව, ඒ විනාශ කිරීම පිළිබඳ වාර්තාවක් මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1ඇ) (1අ) වන හෝ (1ආ) වන උපවගන්තිය යටතේ යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක්, සැකසුමක් හෝ සාම්පලයක් ලැබීමෙන් පසු,

ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින්, ඒවායෙහි ඇසුරුම් සහ මුද්‍රා ද ඇතුළුව ඒ ඖෂධයේ, ද්‍රව්‍යයේ, භාණ්ඩයේ හෝ සැකසුමේ හෝ ඒ සාම්පලයේ ඡායාරූප ගැනීම සහ හැකි අවස්ථාවල දී වෙනත් වීඩියෝ පටිගත කිරීම් සිදු කිරීම ද කරනු ලැබිය යුතු ය.'';

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ ''භාණ්ඩයක් හෝ සැකසුමක් පිළිබඳ පරීක්ෂණයක්'' යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ සියලු ම වචන වෙනුවට පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

''භාණ්ඩයක් හෝ සැකසුමක් හෝ සාම්පලයක් පිළිබඳ පරීක්ෂණයක් සිදු කර ඇති අවස්ථාවක දී, ඔහු විසින්, එසේ ඉදිරිපත් කරන ලද දින සිට මාස දෙකක් නොඉක්මවන කාලසීමාවක් තුළ -

(අ) ඔහුගේ පරීක්ෂණයේ ප්‍රතිඵලය සඳහන් වාර්තාවක්; සහ

(ආ) (1ඇ) වන උපවගන්තිය යටතේ ගන්නා ලද ඡායාරූප, මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික යන දෙයාකාරයෙන් ම සහ වීඩියෝ පටිගත කිරීම්,

එකී පරීක්ෂණය සඳහා ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම හෝ ඒ සාම්පලය ඔහු වෙත ඉදිරිපත් කරන ලද විමර්ශකවරයා වෙත සහ පොලිස් මත්ද්‍රව්‍ය නාශක කාර්යාංශය වෙත පිටපත් ද සහිතව මහෙස්ත්‍රාත්වරයා වෙත යවනු ලැබිය යුතු ය.'';

(4) ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

''(5) (2) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව සහ අදාළ ඡායාරූප සහ වීඩියෝ පටිගත කිරීම්

ලැබීමෙන් ඉක්බිතිව ම නඩුව පළමුවරට කැඳවනු ලබන දිනයේ දී, චෝදනා ඉදිරිපත් කිරීමට සැකකරුවකු සිටින බවට අධිකරණයට දැනුම් දෙනු ලබන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) සැකකරුට හෝ ඔහුගේ නීතිඥවරයාට ඒ වාර්තාවේ පිටපතක් භාර දීමට සැලැස්විය හැකි ය; සහ

(ආ) (5ආ) වන උපවගන්තිය යටතේ වන ආඥා සඳහා දිනයක් නියම කරනු ලැබිය හැකි අතර ඒ දිනය එසේ පළමු වරට කැඳවන දින සිට දින පහළොවකට පසු නොවන දිනයක් විය යුතු ය.

(5අ) (2) වන උපවගන්තිය යටතේ වූ වාර්තාව සහ අදාළ ඡායාරූප සහ වීඩියෝ පටිගත කිරීම් ලැබීමෙන් ඉක්බිතිව ම, නඩුව පළමුවරට කැඳවනු ලබන දිනයේ දී, චෝදනා ඉදිරිපත් කිරීමට සැකකරුවකු නොමැති බවට අධිකරණයට දැනුම් දෙනු ලබන්නේ නම්, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) ඡායාරූප, වීඩියෝ පටිගත කිරීම්, ඇසුරුම් සහ මුද්‍රා ද ඇතුළුව, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන සාක්ෂි සංරක්ෂණය කිරීම සඳහා ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත ආඥාවක් කරනු ලැබිය හැකි ය; සහ

(ආ) ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම හෝ (1ආ) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද සාම්පලය විනාශ කිරීම සඳහා හෝ විනාශ කිරීමට සැලැස්වීම සඳහා ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත ආඥාවක් කරනු ලැබිය හැකි අතර ඒ විනාශ කිරීම සම්බන්ධයෙන් (5ඇ) වන, (5ඉ) වන සහ (5ඊ) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(5ආ) (5) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් දිනයේ දී මහෙස්ත්‍රාත්වරයා ඉදිරියේ නඩුව කැඳවනු ලබන අවස්ථාවේ දී, ඡායාරූප, වීඩියෝ පටිගත කිරීම්, ඇසුරුම් සහ මුද්‍රා ඇතුළු, ඒ ආඥාවේ නිශ්චිතව සඳහන් කරනු ලබන සාක්ෂි සංරක්ෂණය කරන ලෙස මහෙස්ත්‍රාත්වරයා විසින් ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත ආඥාවක් කරනු ලැබිය යුතු අතර -

(අ) (4) වන උපවගන්තිය යටතේ යම් ප්‍රශ්න කිරීමක් සිදු කරනු ලැබ ඇති අවස්ථාවක දී, එය වාර්තා කර, ඒ ඖෂධයෙහි, ද්‍රව්‍යයෙහි, භාණ්ඩයෙහි හෝ සැකසුමෙහි සාම්පලයක් හෝ (1ආ) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද සාම්පලය රඳවා තබා ගැනීමෙන් පසුව, ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම විනාශ කරන ලෙස ආණ්ඩුවේ රස පරීක්ෂකවරයා වෙත ආඥාවක් කරනු ලැබිය යුතු ය; හෝ

(ආ) (4) වන උපවගන්තිය යටතේ කිසිදු ප්‍රශ්න කිරීමක් සිදු කර නොමැති අවස්ථාවක දී, ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම හෝ (1ආ) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද සාම්පලය විනාශ කරන ලෙස ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත ආඥාවක් කරනු ලැබිය යුතු ය.

(5ඇ) (5ආ) වන උපවගන්තිය යටතේ කරනු ලබන ආඥා, මහෙස්ත්‍රාත්වරයා විසින් -

(අ) ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ ඔහුගේ අනුයෝජිතයා;

(ආ) පැමිණිල්ලේ නීතිඥවරයා හෝ පැමිණිල්ල මෙහෙයවන විමර්ශකවරයා හෝ ඔහුගේ අනුයෝජිතයා; සහ

(ඇ) වින්තියේ නීතිඥවරයකු වෙතොත් එම විත්තියේ නීතිඥවරයා හෝ සැකකරුවකු වෙතොත් එම සැකකරු,

ඉදිරිපිට දී කරනු ලැබිය යුතු ය.

(5ඇ) (5ආ) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥා අවසානාත්මක සහ තීරණාත්මක විය යුතු අතර කිසිදු අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(5ඉ) (5ආ) වන උපවගන්තිය යටතේ කරන ලද ආඥාවල පිටපතක් ඒ අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා වෙත වහාම යවනු ලැබිය යුතු ය.

(5ඊ) ආණ්ඩුවේ රසපරීක්ෂකවරයා විසින්, (5ඉ) වන උපවගන්තිය යටතේ වන ආඥාවල පිටපත තමා වෙත ලැබුණු දින සිට සති දෙකක කාලසීමාවක් ඇතුළත -

(අ) ඒ ආඥාවට අනුකූලව සහ (6) වන උපවගන්තිය යටතේ නියම කරනු ලැබිය හැකි කාර්යපටිපාටියට අනුව, මහෙස්ත්‍රාත්වරයකුගේ අධීක්ෂණය යටතේ ඒ ඖෂධය, ද්‍රව්‍යය, භාණ්ඩය හෝ සැකසුම හෝ සාම්පලය විනාශ කිරීම හෝ විනාශ කිරීමට සැලැස්වීම කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඒ විනාශ කිරීමට අදාළ වාර්තාවක් අදාළ අධිකරණයට වහාම ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5උ) III වන පරිච්ඡේදය හෝ V වන පරිච්ඡේදය යටතේ සිදු කරන ලද යම් වරදක් විභාග කිරීම සඳහා අධිකරණ බලය ඇති නිසි අධිකරණයේ

විනිශ්චයකාරවරයා විසින්, නඩු විභාගය අවසානයේ දී, (5ආ) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ රඳවා තබා ගන්නා ලද සාම්පල විනාශ කරන ලෙස ආඥාවක් වහාම කරනු ලැබිය යුතු අතර, (5ඉ) වන සහ (5ඊ) වන උපවගන්තිවල විධිවිධාන, එම විනාශ කිරීම සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.'';

(5) ඒ වගන්තියේ (6) වන උපවගන්තියේ '' එකඟත්වය ඇතිව, (5) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති'' යන වචන සහ ඉලක්කම්වල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන සහ ඉලක්කම් වෙනුවට, පහත දැක්වෙන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:-

''එකඟත්වය ඇතිව -

(අ) (1) වන සහ (1ඇ) වන උපවගන්ති යටතේ ගනු ලැබිය යුතු ඡායාරූපවලට සහ වීඩියෝ පටිගතකිරීම්වලට අදාළ පිරිවිතර;

(ආ) (5ආ) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ රඳවා තබා ගනු ලැබිය යුතු සාම්පලයේ ප්‍රමාණය; සහ

(ඇ) මේ වගන්තිය යටතේ යම් ඖෂධයක්, ද්‍රව්‍යයක්, භාණ්ඩයක් හෝ සැකසුමක් හෝ එහි සාම්පලයක් විනාශ කිරීමේ ක්‍රමවේදය,

නියෝග මගින් නියම කරනු ලැබිය හැකි ය.'';

(6) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

''(7) මේ වගන්තියේ කාර්ය සඳහා, ''විමර්ශකවරයා'' යන්නෙන්, මේ ආඥාපනතේ V වන පරිච්ඡේදය යටතේ වන වැරදි සම්බන්ධයෙන්

විමර්ශන සිදු කිරීම සඳහා බලය ලබා දී ඇති යම් නීතිය බලාත්මක කිරීමේ නිලධරයකු අදහස් වන අතර ඊට පොලිස් නිලධරයකු, රේගු නිලධරයකු සහ සුරාබදු නිලධරයකු ද ඇතුළත් වේ.”; සහ

(7) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

“ඖෂධ ආදිය
විශ්ලේෂණය කිරීම සහ
විනාශ කිරීම.”.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

**3.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.